# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සංශෝධනයයි**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

***මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවය III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026***

උක්ත බඳවා ගැනීමට අදාළව 2026.09.18 දින අංක 2507 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළාත් සභා කොටසේ පළ කරන ලද නිවේදනය මගින් මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමට සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා ඇත.

02. මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි 2014.06.30 දින අංක 1869/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව සකස් කරන ලද, 2026.09.18 දිනැති ඉහත විවෘත බඳවා ගැනීමේ නිවේදනය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

06. (ආ) වගන්තිය සංශෝධනය

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2008.10.16 දින හෝ ඊට පෙර හා 1991.10.16 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

03. 2026.09.18 දිනැතිව නිකුත් කරන ලද "මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවය III ශ්‍රෙණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026" බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් අනෙකුත් සියලුම කොන්දේසි එලෙසම බලපවත්වන බව කාරුණිකව දැනුම් දෙමි.

කේ. කේ. ජී. අයි. ඩී. පී. විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

10-516

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.